**නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාව - 2021**

------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තා**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණු එකතුව රු.1,010,000ක් වූ ඉඩම් 3ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | ඉඩම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලද වැඩ නිමි වටිනාකම වු රු.28,976,233ක් ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදි වටිනාකම බිල්පත පරීක්ෂා කර අවසන් කිරීමෙන් පසු ගිණුම්ගත කරන බව. | වැඩ නිමි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කළ වැඩ වටිනාකම ගණනය කර නොතිබුණු සම්පූර්ණයෙන් නිමි කර්මාන්ත 16කද , අඩක් නිමි කර්මාන්ත 27ක් හා ගිවිසුම් ගත වූ නමුත් වැඩ ආරම්භ නොකළ කර්මාන්ත 47ක්ද වශයෙන් කර්මාන්ත 90ක ගිවිසුම්ගත වටිනාකම වු රු.57,686,318 ක් ගිණුම්ගත කිරීම හේතුවෙන් කර්මාන්ත ණය හිමියෝ හා ප්‍රග්ධන වියදම් එම ප්‍රමාණයෙන් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි. | දෙසැම්බර් 31 දින වන විට වැඩ අවසන් කර ඇති අතැති බිල්පත් වටිනාකම් පමණක් ඉදිරියේදී කර්මාන්ත ණය හිමියන් ලෙස ගිණුම්ගත කරන බව. | වැඩ අවසන් කර ඇති වටිනාකම් පමණක් කර්මාන්ත ණය හිමියන් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ඉටු කරන ලද කර්මාන්ත 37කට අදාළව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යංශයෙන් ලැබිය යුතු වටිනාකම රු.988,386ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි. | ඇස්තමේන්තු මුදල ඉක්මවා ලැබිය යුතු වටිනාකම ලෙස ගිණුම්ගත කර ඇති මුදල පරිපාලන වියදම් ලෙස සභාව වෙත ලබා දෙනු ඇතැයි අපේක්ෂාවෙන් ගිණුම්ගත කළ බව. | ලැබිය යුතු නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.153,111,736ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.106,000,263ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

-----------------------

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අංශයේ ඒකක 162ක් සඳහා රු.268,981ක්ද, පෞද්ගලික අංශයේ ඒකක 11802ක් සඳහා රු.21,585,393ක්ද ලෙස එකතු වටිනාකම රු.21,854,374ක් අයවිය යුතුව තිබුණි. ඉන් 2022 අගෝස්තු 31 දිනට රාජ්‍ය අංශයේ ඒකක 48ක් සඳහා රු.80,373ක්ද, පෞද්ගලික අංශයේ ඒකක 4036ක් සඳහා රු.2,834,584ක්ද අයකර තිබුණි. | ජංගම වැඩසටහන් මඟින් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ හිටි වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **අක්කර බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අංශයේ බදු ඒකක 19ක් සඳහා රු.47,155ක්ද, පෞද්ගලික අංශයයේ බදු ඒකක 687ක් සඳහා රු.673,236ක්ද ලෙස එකතු වටිනාකම රු.720,391ක් අයවිය යුතුව තිබුණි. ඉන් 2022 අගෝස්තු 31 දිනට පෞද්ගලික අංශයෙන් පමණක් ඒකක 22ක් සඳහා රු.14,571ක් අයකර තිබුණි. | අක්කර බද්දට යටත් නොවන දේපළ සඳහා වන අක්කර බදුද වන බැවින් එම හිඟ කපාහැර එම දේපළ වරිපනම් බදු වලට යටත් කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. අයිතිකරුවන් නොමැති හා හඳුනාගත නොහැකි දේපළ කපා හැරීම ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ ඉදිරියේදී සිදු කරන බව. | හිඟ හිටි අක්කර බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකක 62ක් සඳහා කඩ කුලී රු.1,388,975ක්ද ඒකක 27ක් සඳහා බදු කුලී රු.2,969,962ක්ද වශයෙන් ඒකක 89ක් සඳහා එකතු වටිනාකම රු.4,358,937ක් අයවිය යුතුව තිබුණි. ඉන් 2022 අගෝස්තු 31 දිනට කඩ කුලී ඒකක 57ක් සඳහා රු.719,682ක්ද බදු කුලී ඒකක 15ක් සඳහා රු.439,866ක් අයකර තිබුණි. | හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ හිටි කඩකුලී හා බදු කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **වෙනත් ආදායම්**

-------------------

| | | |
|---|---|---|
| 2020 වර්ෂයේ දෙසැම්බර් 24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ iv (ආ) කොටසේ (පළාත් පාලනය) සඳහන් විධිවිධාන ප්‍රකාරව වාර්ෂික බලපත්‍රයක් සඳහා රු.1,250ක මුදලක් අයකර ගත යුතු වුවත් පරිසර බලපත්‍ර ආදායම් ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 136කින් රු.273,000ක් අයවිය යුතුව තිබුණි. ඉන් 2022 අගෝස්තු 31 දිනට කර්මාන්ත 47කින් රු.72,500ක් අයකර ගෙන තිබූ අතර කර්මාන්ත 22ක ව්‍යාපාර කටයුතු අවසන් කිරීම හේතුවෙන් රු.60,500ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ හිටි ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

ප්‍රාදේශීය සභා පනත 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 වාහන පද්ධති කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් කැබ් රථයක් 2019 ජුනි 13 දින අනතුරට ලක් වී තිබුණි. එදින වාහනයේ රියදුරු නිවාඩු ලබා තිබීම හා රාජකාරි ආවරණය කිරීම සඳහා රියදුරෙකු නොයෙදීම හේතුවෙන් සභාවේ සභාපතිවරයා විසින් උක්ත දිනයේදී වාහනයේ රියදුරු ලෙස කටයුතු කර තිබුණි. මෙහිදී වාහනය ධාවනය කළ සභාපතිවරයාට අධික වේගය පාලනය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් මාර්ගයේ වම් පැත්තට ඉවතට පැන බෝක්කුවේ වැදීමෙන් කැබ් රථයේ ඉදිරිපස, පසුපස, වම්පස හා දකුණු පස බඳට හානි වී තිබූ අතර වාහනයට සිදු වූ අලාභය රු.2,900,000ක් විය. අනතුර සම්බන්ධයෙන් පරීක්ෂණ කළ කමිටුව විසින් අලාභ හානි පිළිබඳ වගකීම් පැවරී ඇති නිළධාරියා හට මු.රෙ 105හි දක්වා ඇති ආකාරයට ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව විනයානුකූලව කටයුතු කළ යුතු බව දක්වා තිබුණද 2019 නොවැම්බර් 20 දින වන විටත් එම නිර්දේශය ක්‍රියාත්මක කළ බවට සාක්ෂියක් විගණනයේදී අනාවරණය නොවිණි. | උත්සවයක් සඳහා සභාපතිතුමාගේ සහභාගී වීම අත්‍යාවශ්‍ය වූ නිසා සභාපතිතුමා විසින් කැබ් රථය පදවා ඇති බව දන්වා සිටින අතර කැබ් රථයේ රියදුරු එදින හදිසි නිවාඩු වාර්තා කර ඇති බැවින් රියදුරු සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු නොකල බව. | පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් කළ නිර්දේශය අනුව කටයුතු කළ යුතුය. |